සැ. යු. - 2024.04.19 දින පළ කරන ලද අංක 2,381 *ගැසට් පත්‍රයේ* III සහ IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,382 - 2024 අප්‍රේල් මස 26 වැනි සිකුරාදා - 2024.04.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 138 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 140 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2024 මැයි මස 17 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 මැයි මස 03 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


137- B 082563 — 353 (2024/04)
D 1 -

# පිස්කල් විකිණීම්

## ත්‍රිකුණාමලය දිසා අධිකරණයේ දී ය

### පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී,
(කලින් මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගම වශයෙන්
හැඳින්වූ) අංක 236, ගාලු පාර, කොළඹ 03.

............................*පැමිණිලිකරු.*

කොළඹ දිසා අධිකරණ
නඩු අංකය : DHP - 00591/15

ත්‍රිකුණාමලය දිසා අධිකරණය
ඇස්කිසි අංකය - No/8/21

*එදිරිව*

1. තේනුවර හැන්නදිගේ එරංග බුද්දික,
අංක 10/13, එන් සී පාර, ත්‍රිකුණාමලය.

2. වික්‍රම කලුතොට හේවාගේ අනිල් කුමාර,
අංක 88/01, ගාමිණි දිසානායක මාවත, මහමායාපුර,
ත්‍රිකුණාමලය.

3. අතුල සමන්ත ක්‍රිස්තෝගු,
පාසල පාර, චම්පා පටුමග,
අන්දන්කුලම, ත්‍රිකුණාමලය.

......................*විත්තිකරුවන්.*

ඉහත අංක දරන නඩුවේ වර්ෂ 2016ක් වූ සැප්තැම්බර් මස 23 වැනි දින දරන තීන්දු ප්‍රකාශය ප්‍රකාර ඉහත නම් සඳහන් 3 වන විත්තිකරු විසින් පැමිණිලිකාර සමාගම වෙත ගෙවිය යුතුව ඇති, රු. 2,363,532.23 ක මුදල හා තීන්දු ප්‍රකාශයේ දින සිට එකී මුදලට අදාළ නෛතික පොළිය එක්ව හෝ වෙන් වෙන්ව ගෙවීමටත්, පොළිය අයකර ගැනීමේ දී සිවිල් ආඥාපනතේ 5 වන වගන්තියට අදාළ විය යුතු බවටත් ද වේ.

එකී නඩුවෙන් මා වෙත නිකුත්කර ඇති දේපළ තහනමට ගෙන විකිණීමේ ඇස්කිසියේ බලයපිට තහනමට ගෙන ඇති ඉහත 3 වන විත්තිකරු සතු චංචල දේපළ වර්ෂ **2024**ක් වූ **ජුනි** මස **24** වැනි දින ප. ව. **1.00**ට ත්‍රිකුණාමලය, අන්දන්කුලම, චම්පා පටුමග, පාසල පාර යන ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### *උපලේඛනය*

1. සැම්සුන් වර්ගයේ LED අඟල් 32 පමණ රූපවාහිනී 01 සහ එම රඳවනය සමග ඩයලොග් රවුටර් 01යි
2. වීදුරු සහිත අඩි 05 පමණ උස ලී කැබිනට් 01යි
3. කළු සහ මෙරූන් පාට ප්ලාස්ටික් පුටු (කළු පැහැති 06 මෙරූන් පැහැති 03යි)
4. අඩි 6 1/2 x 3 ලී කෑම මේස 01 සහ කැටයම් සහිත කුෂන් කරන ලද ලී පුටු 06යි
5. ටෙලිසොනික් වර්ගයේ ස්ටෑන්ඩ් ෆෑන් 02 යි
6. දොර 03 අඩි 5 1/2 පමණ උස වානේ අල්මාරි 02යි (අළු සහ දුඹුරු)
7. OMAQ වර්ගයේ ඉලෙක්ට්‍රික් තරාදි 01යි
8. සිංගර් වර්ගයේ තනිදොර අලු පැහැති ශීතකරණ 01යි
9. ෂෙල් වර්ගයේ කි.ග්‍රෑ. 12 ගෑස් සිලින්ඩරය
10. අබාන්ස් වර්ගයේ කි.ග්‍රෑ. 7.5 රෙදි සෝදන යන්ත්‍ර 01 සහ හේයර් වර්ගයේ කි.ග්‍රෑ. 7 රෙදි සෝදන යන්ත්‍ර 01යි

11. දම්රෝ වර්ගයේ දුඹුරු පැහැති කාර්යාල මේස 01යි
12. SUDROLLA වර්ගයේ වතුර මෝටර් 01යි

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
ත්‍රිකුණාමලය.

වර්ෂ 2024ක් වූ අප්‍රේල් මස 09 වැනි දින දී ය.

04-393/1

---

## ත්‍රිකුණාමලය දිසා අධිකරණයේ දී ය

### පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී,
(කලින් මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගම වශයෙන් හැඳින්වූ)
අංක 236, ගාලු පාර, කොළඹ 03.

*............................පැමිණිලිකරු.*

*එදිරිව*

කොළඹ දිසා අධිකරණ
නඩු අංකය : DHP - 00591/15

ත්‍රිකුණාමලය දිසා අධිකරණය
ඇස්කිසි අංකය - 1/19

1. තේනුවර හැන්නදිගේ එරංග බුද්ධික,
අංක 10/13, එන් සී පාර, ත්‍රිකුණාමලය.

2. වික්‍රම කලුතොට හේවාගේ අනිල් කුමාර,
අංක 88/01, ගාමිණී දිසානායක මාවත, මහමායාපුර,
ත්‍රිකුණාමලය.

3. අතුල සමන්ත ක්‍රිස්තෝගු,
පාසල පාර, චම්පා පටුමග,
අන්දන්කුලම, ත්‍රිකුණාමලය.

*......................විත්තිකරුවන්.*

ඉහත අංක දරන නඩුවේ වර්ෂ 2016ක් වූ සැප්තැම්බර් මස 23 වැනි දින දරන තීන්දු ප්‍රකාශය ප්‍රකාර ඉහත නම් සඳහන් 2 වන විත්තිකරු විසින් පැමිණිලිකාර සමාගම වෙත ගෙවිය යුතුව ඇති රු. 2,363,532.23 ක මුදල හා තීන්දු ප්‍රකාශයේ දින සිට එකී මුදලට අදාළ නෛතික පොළිය එක්ව හෝ වෙන් වෙන්ව ගෙවීමටත්, පොළිය අයකර ගැනීමේ දී සිවිල් ආඥාපනතේ 5 වන වගන්තියට අදාළ විය යුතු බවටත් ද වේ.

එකී නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති දේපල තහනමට ගෙන විකිණීමේ ඇස්කීසියේ බලය පිට තහනමට ගෙන ඇති ඉහත 2 වන විත්තිකරු සතු චංචල දේපල වර්ෂ **2024ක් වූ ජුනි මස 24 වැනි දින පෙ. ව. 10.00** ට ත්‍රිකුණාමලය, මහමායාපුර, ගාමිණී දිසානායක මාවත, අංක 88/01 දරන ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

1. EP BCG 6954 අංක දරන ප්ලෙෂර් වර්ගයේ යතුරුපැදි 01
2. පාපැදි 01

3. දුඹුරු පැහැති ඇඳි සහිත ප්ලාස්ටික් පුටු 10 යි
4. අඩි 04ක් පමණ දිග දුඹුරු පැහැති දම්රෝ මේස 01යි
5. SGL වර්ගයේ අගල් 42 පමණ LED වර්ණ රූපවාහිනී 01 සහ සබ්වූපර් සෙට් 01 සහ DVD ප්ලේයර් 01 යි
6. ඉනෝවෙක්ස් වර්ගයේ ස්ටෑන්ඩ් ෆෑන් 02 යි
7. අයන් බෝඩ් 01යි
8. සැම්සුම් වර්ගයේ අඩි 5 පමණ ශීතකරණ 01යි
9. අඩි 5 1/2 x 5 කැටයම් සහිත ලී අල්මාරි 01යි
10. කුඩා ලියන මේස 01යි
11. අඩි 6 x 4 දොර දෙකේ වානේ අල්මාරි 01යි
12. කාර්යාල පුටු 01යි (නිල් පැහැති)

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
ත්‍රිකුණාමලය.

වර්ෂ 2024ක් වූ අප්‍රේල් මස 09 වැනි දින දී ය.

04-393/2

---

# විවිධ දැන්වීම්

## කොළඹ වාණිජ මහාධිකරණයේ දී ය

*නඩු අංකය :* CHC/04/2024/CO

2007 අංක 07 දරන සමාගම් පනතේ 267(1)(අ), 270(ඉ) සහ (ඊ) හා 272 (1) වන කොටස් යටතේ කොළඹ 06, හැව්ලොක් පාරේ අංක 291/2 හි ඒෂියන් වෙයාහවුසින් පුද්ගලික සමාගම අධිකරණය විසින් ගණන් බේරා වසා දමන ලෙස වූ අයදුම්පතක් පිළිබඳ කාරණාවේ දී ය.

ඉලේකුට්ටිගේ ලොරේන් නිර්මලා තිලකරත්න,
අංක 05, ශාන්ත ආනා පාර, පොල්කොටුව,
බේරුවල.

............................*පෙත්සම්කරු,*

ඉහත සඳහන් පෙත්සම්කරු වන බේරුවල පොල්කොටුව, අංක 05, ශාන්ත ආනා පාර හි ඉලේකුට්ටිගේ ලොරේන් නිර්මලා තිලකරත්න විසින් ස්වකීය නීතිඥ එම්. ඒ. ටී. දේශාන් විමලරත්න මගින් පෙනී සිටිමින් ඉහත සඳහන් සමාගම කොළඹ වාණිජ මහාධිකරණය විසින් අවසන් කිරීම (ගනුදෙනු බේරා වසාලීම) සඳහා පෙත්සමක් වර්ෂ **2024ක්** වූ **ජනවාරි** මස **11** වැනි දින එකී අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද බව මෙයින් දන්වා සිටිනු ලැබේ. එම පෙත්සම වර්ෂ **2024ක්** වූ මැයි මස **27** වැනි දින අධිකරණය ඉදිරියේ ඇසීමට නියම කරනු ලැබ ඇත. ඉහත සඳහන් සමාගමේ යම් ණය හිමියෙකු හෝ ආධාරකරුවෙකු ඉහත සඳහන් පෙත්සම සම්බන්ධයෙන් නියෝගයක් පැනවීම ගැන සහයෝගයක් හෝ විරුද්ධත්වයක් දැක්වීමට කැමැත්තේ නම්, පෙත්සම සම්බන්ධයෙන් කරුණු අසනු ලබන අවස්ථාවේ දී, තමන් පෞද්ගලිකව හෝ තමන්ගේ නීති උපදේශකතැන මගින් හෝ තමන්ගේ නීතිඥවරයා මගින් හෝ මේ සඳහා පෙනී සිටීමට පුළුවන. ඉහත සඳහන් සමාගමේ කවර හෝ ණය හිමියෙකුට හෝ ආධාරකරුවෙකු හට පෙත්සමේ පිටපතක් ලබා ගැනීමට අවශ්‍ය නම් ඒ සඳහා නියමිත මුදල ගෙවීමෙන් පහත සඳහන් අයගෙන් එය ලබාගත හැකිය.

ඉලේකුට්ටිගේ ලොරේන් නිර්මලා තිලකරත්න,
පෙත්සම්කරු,
අංක 05, ශාන්ත ආනා පාර, පොල්කොටුව,
බේරුවල.

දුරකථන අංකය : 077 3545271

*සැලකිය යුතුයි.-*

කවර හෝ පුද්ගලයෙකු ඉහත සඳහන් පෙත්සම සම්බන්ධයෙන් කරුණු අසන අවස්ථාවේ දී පෙනී සිටීමට අදහස් කරන්නේ නම් ඔහුගේ එම අදහස් දක්වමින් ඉහත සඳහන් පෙත්සම්කරු, ඉලේකුට්ටිගේ ලොරේන් නිර්මලා තිලකරත්න වෙත ලිඛිත දැන්වීමක් බාරදීම හෝ තැපෑලෙන් එවීම හෝ කළ යුතු ය. මෙම දැන්වීමෙහි පුද්ගලයාගේ නම හා ලිපිනය සඳහන් විය යුතු ය. *නැතහොත්* සමාගමක් නම් එහි නම හා ලිපිනය සඳහන් විය යුතු වන අතර, එම පුද්ගලයා හෝ සමාගම හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ නීතිඥවරයා (වෙතොත්) විසින් අත්සන් කළයුතු වනවා මෙන්ම, එය ඉහත සඳහන් අය වෙත කල් වේලාව ඇතුව එනම් වර්ෂ **2024 මැයි මස 25 වැනි දින පස්වරු 1.00ට** පෙර භාර දිය යුතුය. *නැතහොත්* තැපෑලෙන් එවිය යුතු ය.

ඉලේකුට්ටිගේ ලොරේන් නිර්මලා තිලකරත්න,
පෙත්සම්කරු.

අංක 05, ශාන්ත ආනා පාර, පොල්කොටුව,
බේරුවල.

04-379

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.